සැ. යු. - 2024.09.27 දින පළ කරන ලද අංක 2404 *ගැසට් පත්‍රයේ* II, III සහ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,405 - 2024 ඔක්තෝබර් මස 04 වැනි සිකුරාදා - 2024.10.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 928 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 930 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ඔක්තෝබර් 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ඔක්තෝබර් 11 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## හලාවත ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයේ අයවැය කෙටුම්පත

හලාවත ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය 2024 ඔක්තෝබර් මස 07 දින සිට 2024 ඔක්තෝබර් මස 16 වැනි දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ හලාවත ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව හලාවත ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීතිවල 10.2(අ) රීතිය ප්‍රකාර මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. පී. එන්. රණතුංග,
ලේකම්,
හලාවත ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 01 වැනි දින,
හලාවත ප්‍රාදේශීය සභාව,
මාදම්පේ.

10-41

---

## ආණමඩුව ප්‍රාදේශීය සභාව

2025 කෙටුම්පත් අයවැය ලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2020.10.29 දින අංක 2199/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 10(2) ප්‍රකාරව, ආණමඩුව ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂය සඳහා සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය 2024-10-07 දින සිට 2024-10-15 වන දින දක්වා රජයේ වැඩ කරන දිනයන්හි දී, කාර්යාල වේලාව තුළ ආණමඩුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී මහජනතාවට පරීක්ෂාකර බැලීම සඳහා අවස්ථාව සලසා ඇති බව මෙයින් දැනුම් දෙමි.

එච්. ජේ. එම්. එම්. එස්. ජයසුන්දර,
ලේකම්,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

10-24

---

## කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයේ අයවැය කෙටුම්පත

කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය 2024 ඔක්තෝබර් මස 01 වැනි දින සිට 2024 ඔක්තෝබර් මස 25 වැනි දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ කොබෙයිගනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීතිවල 10.2(ආ) රීතිය ප්‍රකාර මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. එස්. එම්. ප්‍රනාන්දු,
ලේකම්,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව,
කොබයිගනේ

10-23

**පොල්පිතිගම ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂයට යෝජිත අයවැය කෙටුම්පත

පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය සඳහා යෝජිත අයවැය කෙටුම්පත 2024 ඔක්තෝබර් මස 07 දින සිට 2024 ඔක්තෝබර් මස 15 වැනි දින දක්වා (සෙනසුරාදා, ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී සහ පොල්පිතිගම, ගල්ටැංවැව, මොරගොල්ලාගම, සියඹලන්ගමුව, මඩහපොල, තලමල්ගම යන පුස්තකාලවලදී මහජන පරීක්ෂාව පිණිස තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීතිවල 10(2) රීතිය ප්‍රකාර මහජනතාව වෙත මෙයින් නිවේදනය කර සිටිමි.

අයි. එම්. උදේනිකා මොහොට්ටි,
ලේකම්,
පොල්පිතිගම ප්‍රාදේශීය සභාව.

10-48

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

විනෝද බදු පැනවීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අය කරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වන උපවගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වන උපවගන්තිය ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් 2024.03.05 දින අංක 1122 යටතේ සටහන් කරමින් ගෙන ඇති තීරණය වයඹ පළාතේ ආණ්ඩුකාරවර නසීර් අහමඩ් වන මම 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වන උපවගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

නසීර් අහමඩ් (ඉංජි),
වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවර.

2024 අගෝස්තු මස 27 වැනි දින,
වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

**තීරණය**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වන උපවගන්තිය සමග කියවිය යුතු 1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වන උපවගන්තියෙන් ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන ගෙවීමකින් සියයට දහයක (10%) ට සමාන බද්දක් පනවා අය කළ යුතු යැයිද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන අනුව ගරු වයඹ පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ *ගැසට් පත්‍රයේ* පළ කිරීමටත්, පෙර කී *ගැසට් පත්‍රය* පළ කරන මාසයට ඉක්බිතිව එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු බවටත් තීරණය කරමි."

09-16

**පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාව**

තක්සේරු වාර්තා ප්‍රදර්ශනය කිරීම සහ විරෝධතා දැක්වීම

පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව තුළ පලෙයි නගර ප්‍රදේශයට අයත් සියලුම නේවාසික, වාණිජ ගොඩනැගිලි, ඉඩම් සහ නිවාසවල වාර්ෂික වටිනාකම ප්‍රාදේශීය සභා පනතේ අංක 134 සහ 141(3) යටතේ පැවරී ඇති බලතල අනුව සටහන්කර ඇත. 1987 අංක 15 දරන වරිපනම් ලේඛනය 2024.09.20 සිට 2024.10.20 දක්වා කාර්යාල දිනවලදී පෙරවරු 8.30 සිට පස්වරු 4.00 දක්වා පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ මහජන ප්‍රදර්ශනය සඳහා ප්‍රදර්ශනය කෙරෙන බව මෙයින් දන්වා සිටිමි.

එකී වත්කම්වල වාර්ෂික තක්සේරුව සම්බන්ධයෙන් යම් විරෝධතා ඇත්නම් ඉහත සඳහන් කාලසීමාව තුළ ලේකම්, පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාව, පලෙයි යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකි බව හෝ කාර්යාල දිනවලදී පෙ. ව. 8.30 සිට පස්වරු 4.00 දක්වා සෘජුවම ඉදිරිපත් කළ හැකි බවද දන්වා සිටිමි. නිශ්චිත කාලසීමාවෙන් පසුව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

තවද, දේශීය වත්කම්වල වරිපනම් ලේඛනයේ වාර්ෂික තක්සේරුවට අදාළ තොරතුරු බැලීමට අවසර ඇත්තේ ඉඩමේ හිමිකරුට හෝ නීත්‍යානුකූල හිමිකරුට පමණක් බවත්, වරිපනම් ලේඛනයට පැමිණෙන අයට තම අනන්‍යතාව තහවුරුකර ගැනීම අනිවාර්ය ලෙස සලකන බවත් විශේෂයෙන් සඳහන්කර ඇත.

ටී. දර්ශිනි,
ලේකම්,
පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාව.

10-17

---

# විවිධ දැන්වීම්

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂයට අදළ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය සමඟ කියවිය යුතු 147 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවක් විසින්, එම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව ඇතුළත පහත දැක්වෙන බලපත්‍ර ගාස්තු නියම කිරීම හා අය කිරීම කරනු ලැබිය හැකිය. ඒ අනුව වාර්ෂික වටිනාකම මත පදනම් වූ බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/312 යටතේ පහත සඳහන් තීරණය කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී වෙළඳ බලපත්‍ර ගාස්තුව 2025 වර්ෂයේ මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ගෙවා නිම කළ යුතු අතර, රජය මගින් පනවා ඇති බදු මුදල් ද වෙළඳ බලපත්‍ර ගාස්තුවලට අමතරව ගෙවිය යුතු වේ.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තාවූ ද වන අවස්ථාවක, ඉහත 2 වන කොටසේ කුමක් සඳහන්ව තිබුණා ද ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභා ලේකම් විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන්පළෙ හි 2024 වර්ෂය තුළ ලැබීම්වලින් සියයට එකක් (1%) විය යුතු බවට තීරණය කරමි.

**උපලේඛනය**

| *I වන තීරුව* | | *II වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යයන්* | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | පළතුරු වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | සිල්ලර වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | එළවළු වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | සිල්ලර වෙළෙඳාම (තොග) | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | පාපැදි අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | මෝටර් රථ අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ත්‍රී රෝද රථ අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ලී මෝල (අතින් ඉරන ලද ලී) | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | වඩු මඩුවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | විදුලි කර්මාන්ත වැඩපළවල් (ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර) | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | අනුමත ආයතන තුළ සකස් කර පැකට් කරන ලද ශීත කළ කුකුල් මස් හා මාළු අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | කරවල විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | බිත්තර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ග්‍රොසරි | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | පුවක්, කරුංගා, ගම්මිරිස්, කෝපි මිලට ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | කැබලි රෙදි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | හම්/රෙක්සින් භාණ්ඩ නිපදවීම (සපත්තු, බෑග් හා වෙනත්) | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ශබ්ද වාහිනී යන්ත්‍ර ක්‍රියාකරවීම හා කුළියට දීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | හෝටල් | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | බත් කඩ, ආපනශාලා සහ තේ කඩ | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | බේකරි | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | කිරිපට්ටි හා කිරි වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ලොන්ඩරි | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | සංචාරක වෙළෙඳාම (වඩේ, ටෙස්, බයිට් වර්ග, බේකරි නිෂ්පාදන) | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | පොදු වෙළෙඳ පළ | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | බාබර් සාප්පු | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | සුවඳ විලවුන් හෝ විෂබීජ නාශක විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වන තීරුව* | | *II වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යයන්* | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 31. | තීන්ත/වාර්නිෂ් වර්ග විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | නවාතැන් පහසුකම් සහිත ව්‍යාපාර | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | පරිගණක මුද්‍රණ කටයුතු | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | හාල් තොග හා සිල්ලර | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ඔරලෝසු අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |

*සැ. යු.-* සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් ආපනශාලා සහ ලැගුම්හල් පෙර වර්ෂයේ ලැබීම් 1% බලපත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු ය.

**අප්‍රසන්න ව්‍යාපාර :**

| | | | | |
|---|---|---|---|---|
| 36. | කෘෂි රසායන ද්‍රව්‍ය ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ඇසිඩ් වර්ග නිෂ්පාදනය හා වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ෆයිබර් ග්ලාස් නිපදවීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | සත්ත්ව පාලනය (කිරි හා මස් සඳහා) | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | සත්ත්ව ආහාර නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | ගෘහ භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | වේවැල් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ඉටිපන්දම් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | ගඩොල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති, බ්ලොක්ගල් නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | පැළ තවානක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

**ප්‍රසන්න හා අන්තරාදයක ව්‍යාපාර :**

| | | | | |
|---|---|---|---|---|
| 1. | පොහොර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | සිප්පි ඇඹරුම්හලක් හා රසායනික ද්‍රව්‍ය නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | බැටරි චාර්ජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | තැඹිලි, කුරුම්බා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | හුණු ගල් පිළිස්සීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | කළුගල් වැඩපළක් | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | රූපලාවන්‍යාගාර | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, අධිශීතකරණ යන්ත්‍ර අලුත්වැඩියාව | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | බිම්මල් වගාව හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |

| *I වන තීරුව* | | *II වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යයන්* | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,500.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| **අන්තරාදායක ව්‍යාපාර :** | | | | |
| 1. | වෑල්ඩින් වැඩපළ (ඔක්සි ඇසිඩ් භාවිතය) | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | වෑල්ඩින් වැඩපළ (විදුලි භාවිතය) | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | වීදුරු තහඩු කැපීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | ඡායා පිටපත් ගැනීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | කුෂන් වැඩපළ | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | හඳුන්කූරු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ගෑස් අලෙවිය/අළෙවි නියෝජිත | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ස්වර්ණාභරණ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ගිනිකෙළි, රතිඤ්ඤා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | වීදුරු භාණ්ඩ අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ග්‍රිල් ගේට්ටු සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ටින්කර් වැඩ | 500 0 | 750 0 | 1,000 0 |

10-33/1

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති කර්මාන්ත සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ කර්මාන්ත බදු 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/313 යටතේ පහත සඳහන් තීරණය කළ බව මහජනතාවට මෙයින් නිවේදනය කරමි.

එකී කර්මාන්ත බදු ගාස්තු 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දින හෝ ඊට පෙර ගෙවා නිම කළ යුතු අතර, රජය මගින් පනවා ඇති බදු මුදල් ද වෙළඳ බලපත්‍ර ගාස්තු වලට අමතරව ගෙවිය යුතුය.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ II වන තීරුවේ, එක් එක් කර්මාන්ත පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තකු 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි.

**උපලේඛනය**

| *I වන තීරුව* | | *II වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.)* | | |
|---|---|---|---|---|
| *අනු. අංකය* | *කර්මාන්තය* | *රු. 750.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 751.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1,501.00 ඉක්මවන අවස්ථාවක* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. | ගඩොල්/සිමෙන්ති ගඩොල්, බීරලු, මල් පෝච්චි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | අයිස්ක්‍රීම්/බීම පැකට් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | කිරි ආශ්‍රිත නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | මැටි භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | පාවහන් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | පැණි/හකුරු නිෂ්පාදනය හා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | අත් යන්ත්‍ර මගින් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | ඉදල්/කොසු/පාපිසි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | හඳුන්කූරු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | බෑග් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ඇඳුම් මැසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ඩිජිටල් තාක්ෂණ මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | බීරළු ලී කැටයම් වැඩපළක් | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පොල්තෙල් මෝලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ස්වර්ණාභරණ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ඡායාරූප ශාලා | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | හුණු හා ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | බලවේග තේ කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | වී මෝල් | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ත්‍රී රෝද රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | පාපැදි, යතුරුපැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | දේශීය බෙහෙත් වර්ග නිෂ්පාදිත ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | මෝටර් රථ යතුරු පැදි අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| | පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | ගල් වළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | යන්ත්‍රානුසාරයෙන් කැටගල් සකස් කිරීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| | පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | වෙල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | ගෘහ භාණ්ඩ විසිතුරු භාණ්ඩ ආදී නිෂ්පාදන | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | කුඩ, වට්ටි වැනි වේවැල් බට ආශ්‍රිත නිෂ්පාදන | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ඉලෙක්ට්‍රික් වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ගරාජ් | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ලී මෝලක් | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | යන්ත්‍රානුසාරයෙන් කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | වායුසමීකරණ ශීතකරණ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | *I* වන තීරුව කර්මාන්තය | *II* වන තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම (රු.) රු. 750.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 751.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක රු. ශත | රු. 1,501.00 ඉක්මවන අවස්ථාවක රු. ශත |
|---|---|---|---|---|
| 41. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | බෑග් මැසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | රස කැවිලි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | වැලි ගොඩ දැමීම හෝ වැලි විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | රූපලාවන්‍ය ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | වීදුරු කැපීම හා පින්තූරු රාමු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | වෑල්ඩිං වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | බිම්මල් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52 | ඉඩම් වෙන්දේසි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | ඔරලෝසු අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | ඉටිපන්දම් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | වාහන පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | වාහන පිරිපහදු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | පහන් තිර නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | වාහන ටෙන්ට් ගැසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | වාහන කර්ටන් ගැසීම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | පුළුන් ආශ්‍රිත නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |

10-33/2

---

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 150 වගන්තිය යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන වෙළඳ බලපත්‍ර ගාස්තුවකට හෝ කර්මාන්ත බද්දකට යටත් නොවූ ව්‍යාපාර හා කර්මාන්ත ස්වභාවයන් සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/314 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී ව්‍යාපාර බදු ගාස්තු 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දින හෝ ඊට පෙර ගෙවා නිම කළ යුතු අතර, රජය මගින් පනවා ඇති බදු මුදල් ද බලපත්‍ර ගාස්තුවලට අමතරව ගෙවිය යුතු වේ.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි ii වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට තීරණය කරමි.

උපලේඛනය

*I* වන කොටස

ව්‍යාපාර

1. සිල්ලර වෙළෙඳසැලක් පැවැත්වීම
2. රෙදිපිළි හෝ නිමි ඇඳුම් අලෙවිසැලක් පැවැත්වීම
3. සාප්පු බඩු අලෙවිසැලක් පැවැත්වීම
4. පාවහන් අලෙවිසැලක් පැවැත්වීම
5. සන්නිවේදන මධ්‍යස්ථානයක් පැවැත්වීම
6. වර්ණ රසායනාගාරයක් පැවැත්වීම
7. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ව්‍යාපාරයක් පැවැත්වීම
8. තීන්ත, සායම් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පැවැත්වීම
9. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පැවැත්වීම
10. පෙරපාසල් දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පැවැත්වීම
11. පරිගණක පුහුණු පාඨමාලාවක් පැවැත්වීම
12. පරිගණක මෘදුකාංග සංවර්ධන මධ්‍යස්ථානයක් පැවැත්වීම
13. රියැදුරු පුහුණුව සපයන ආයතනයක් පැවැත්වීම
14. සමුපකාර සමිති සිල්ලර කඩ (ප්‍රාදේශික) පැවැත්වීම
15. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
16. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පැවැත්වීම
17. මූල්‍ය ආයතනයක් පැවැත්වීම
18. රක්ෂණ සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
19. ලීසිං සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
20. පෞද්ගලික රෝහලක් පැවැත්වීම
21. ස්වර්ණාභරණ විකිණීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම
22. පරිගණක උපාංග විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
23. ලී බඩු විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
24. ප්‍රචාරක කටයුතු කිරීමේ ආයතනයක් පැවැත්වීම
25. උත්සව භාණ්ඩ කුලියට දීම
26. ඇස් කණ්නාඩි සාප්පුවක් පැවැත්වීම
27. ලොතරැයි නියෝජිත ආයතනයක් පැවැත්වීම
28. පිඟන් මැටි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීම
29. රේස් බුකියක් පැවැත්වීම
30. පින්තූර රාමු කිරීම හා වීදුරු කැපීමේ ස්ථානයක් පැවැත්වීම
31. වී මිලදී ගැනීමේ ස්ථානයක් පැවැත්වීම
32. සන්නිවේදන සේවා සැපයීමේ ආයතනයක් පැවැත්වීම
33. ජංගම දුරකථන අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
34. රැකියා නියෝජිත ආයතනයක් පැවැත්වීම
35. වීඩියෝ පට, සංයුක්ත තැටි විකිණීම හෝ කුලියට දීමේ ස්ථානයක් පැවැත්වීම
36. ලිපිද්‍රව්‍ය හෝ පොත් සාප්පුවක් පැවැත්වීම

37. ලී බඩු වෙළඳසැලක් පැවැත්වීම
38. පුවත්පත් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
39. සංගීත භාණ්ඩ හෝ ක්‍රීඩා භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
40. ගබඩාවක් ලෙස කුලියට දෙන ස්ථානයක් පැවැත්වීම
41. විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
42. තොග වශයෙන් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
43. සිමෙන්ති විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
44. ප්‍රසිද්ධ සමාගම්වල භාණ්ඩ බෙදා හැරීමේ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
45. වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
46. යතුරු පැදි, ත්‍රීරෝද රථ අලෙවි කිරීමේ ස්ථානයක් පැවැත්වීම
47. බුලත්, පුවක් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
48. සුපිරි වෙළඳසැලක් (ෆුඩ් සිටියක්) පවත්වාගෙන යාම
49. සත්ත්ව ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන විකිණීමේ නියෝජිත ආයතනයක් පැවැත්වීම
51. භාවිතා කරන ලද වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. භාවිතා කරන ලද මෝටර් සයිකල් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
53. වෛද්‍යවරුන් හා රෝගීන් මුණගස්වන ආයතනයක් (චැනල් සෙන්ටර්) පවත්වාගෙන යාම
54. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
56. වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
57. බලයලත් අරක්කු හා රට බීම විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. බටහිර ඖෂධ විකිණීමේ ස්ථානයක් පැවැත්වීම (ෆාමසි)
59. කුළුබඩු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
62. ජංගම වෙළෙඳ වාහනයක් හෝ ජංගම වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
63. තේ කම්හලක් පැවැත්වීම
64. ගෑස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. පරණ ලෝහ එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
66. එළවළු පළතුරු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
67. තොග වශයෙන් භාණ්ඩ ගබඩා කර විකිණීම (ගල්, වැලි, ගඩොල්, සිමෙන්ති, පොහොර....)

## II වන කොටස

2024 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම

| | *I* තීරුව | *II* තීරුව<br>රු. ශත |
|---|---|---|
| i. | රු. 6,000 නොඉක්මවන විට | අයකිරීමක් නැත. |
| ii. | රු. 6,001 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| iii. | රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| iv. | රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| v. | රු. 75,001 ඉක්මවන නමුත් රු. 150,000 නොඉක්මවන විට | 1,200 0 |
| vi. | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

10-33/3

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා වාහන හා සතුන් සඳහා බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය යටතේ මීගහකිවුල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වාහන හා සතුන් පිළිබඳ බද්දක්, ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර ගාස්තුවක්, අමාත්‍යවරයා විසින් අනුමත කොට පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් ස්ථිර කරන ලද වෙනත් යම් ආකාරයක බද්දක්, හතර වන උපලේඛනයේ සඳහන් වුවද සාමාන්‍යයෙන් එම ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සියලු වාහන සහ සතුන් වෙනුවෙන් ඒ උපලේඛනයේ සඳහන් වූ අනුප්‍රමාණ අනුව වූ වාර්ෂික බද්දක් 2025 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/315 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,<br>
සභා ලේකම්,<br>
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,<br>
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳව බද්දක් 2025 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අය කිරීමට 147 වැනි වගන්තිය ප්‍රකාරව 148 (3) වැනි වගන්තිය යටතේ 2025 මාර්තු 31 වැනි දිනට පෙර අයකිරීමට තීරණය කරමි.

උපලේඛනය

| *අනු. අංකය* | *I තීරුව* | *II තීරුව රු. ශත* |
|---|---|---|
| | *වාහන හා සත්ත්ව බද්ද* | |
| 01. | මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක්, මෝටර් ලොරියක්, රික්ෂෝවක්, කරත්තයක්, බයිසිකලයක් හෝ බයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම | 25 0 |
| 02. | සෑම බයිසිකලයක් හෝ කරත්තයක් සඳහා | |
| | (අ) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | (ආ) වෙළෙඳ කාර්යයන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් පාපැදි බලපත්‍ර ලියාපදිංචි | 04 0 |
| 03. | සෑම කරත්තයක් සඳහාම | 20 0 |
| 04. | සෑම අත්ට්‍රැක්ටරයක් සඳහාම | 10 0 |
| 05. | සෑම රික්ෂෝවක් සඳහාම | 7 50 |
| 06. | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ එළුවෙකු සඳහාම | 15 0 |
| 07. | සෑම ඇතෙකු සඳහාම | 50 0 |

10-33/4

---

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂයට ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසර සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) කොටසේ පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාර මීගහකිවුල

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වීථියකට, පාරකට, ඇළකට, වැවකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් උපලේඛනය සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා අයකළ යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/316 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී බලපත්‍ර ගාස්තුව 2025 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බැව් මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (අ) හා 122-126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල පරිදි සහ 1988.08.23 වැනි දින අංක 520/07 දරන IV (අ) කොටස පළාත් පාලන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන ඡේදය යටතේ ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳව වූ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි මීගහකිවුල ප්‍රාදේශීය සභා සීමාව තුළ කිනම් ආකාරයකට හෝ පෙනෙන පරිදි දැන්වීමක් හෝ ඉදිකිරීමක ප්‍රදර්ශනය යම් වීදියකට/පාරකට/ඇළකට/වැවකට/කුඹුරකට හෝ ඉඩමකට මුහුණ ලා තිබේනම් උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2025.01.01 වැනි දින සිට අයකර ගැනීමට තීරණය කරමි.

| *අනු. අංකය* | *විස්තරය* | *මසක් හෝ ඉන් කොටසක් සඳහා ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 1. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන (චිත්‍රපට දර්ශන, ප්‍රචාරක දැන්වීම් හැර) ඕනෑම දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 45 0 |
| 2. | බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක හෝ ආධාරයක් මගින් ප්‍රදර්ශනය කරවා ඇති ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකට ම | 125 0 |
| 3. | සෑම වර්ගයක ම ප්‍රචාරක බැනරයක් සඳහා සෑම වර්ග අඩියකට ම | 50 0 |
| 4. | චිත්‍රපට දර්ශන ප්‍රචාරය සඳහා ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකට ම | 20 0 |
| 5. | තාවකාලික ප්‍රදර්ශන පුවරු (කටවුට්) සඳහා සෑම වර්ග අඩියකට ම | 40 0 |
| 6. | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා ලිත් වර්ෂයකට වර්ග අඩියකට අයකරනු ලබන මුදල | 200 0 |

10-3/5

---

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

විනෝද බදු පැනවීම

1984 අංක 27 දරන විනෝද බදු සංශෝධිත පනතින් 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියට අනුව 2025 වර්ෂයේ මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන විනෝද බද්දට යටත් යම් කාර්යයකට ඇතුළත්වීම සඳහා අය කරනු ලබන ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා

පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/317 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1984 අංක 27 දරන විනෝද බදු සංශෝධිත පනතින් 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මීගහකිවුල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල අනුව, මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වනු ලබන විනෝද බද්දට යටත් යම් කාර්යයකට ඇතුළත්වීම සඳහා අයකරනු ලබන ගාස්තුවෙන් 10% ක විනෝද බද්දක් පනවා අයකර ගැනීමට තීරණය කරමි.

තව ද, ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ (176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර පැනවෙන බලපත්‍ර ගාස්තුව පහත පරිදි අයකිරීමට තීරණය කරමි.

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 01. | දින 01 කට හෝ දින 07 නොඉක්මවන විට | 250 0 |
| 02. | දින 07 ඉක්මවන විට ඉන් වැඩි වන සෑම දිනකටම හෝ කොටසකටම | 50 0 |
| 03. | ජංගම විනෝද කටයුතු සඳහා | 1,500 0 |

10-33/6

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

1975/77 දරන සමාජ ශාලා ආඥාපනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත යටතේ ගාස්තු පැනවීම

1975/77 දරන සමාජ ශාලා ආඥාපනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත යටතේ ගාස්තු පනවා අය කර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/318 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

තීරණය

1975/77 දරන සමාජශාලා ආඥාපනත හා ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥාපනත යටතේ 2025 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ගාස්තු පනවා අය කිරීම පහත උපලේඛනයෙහි සඳහන් පරිදි සිදුකළ යුතු බව තීරණය කරමි.

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 1. | ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 50 0 |
| 2. | වාර්ෂික බලපත්‍ර ගාස්තුව | 100 0 |

10-33/7

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ සභා ලේකම් වශයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/319 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන තීරණය ගත් බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා පනවන ලද ඒ අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික 04කින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ලැබිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2025 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු වශයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර්තුවට අදළ අක්කර බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%)ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,<br>
සභා ලේකම්,<br>
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,<br>
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද, ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ -

(අ) හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩි වූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක්ම මත 2025 වර්ෂය සඳහා රුපියල් 10.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින් මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) කොටසේ 1989 පෙබරවාරි මස 03 (අ) දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් පහකට අඩු වූ නමුත් හෙක්ටයාර් 01ට නොඅඩු වන සෑම ඉඩමක් මත 2025 වර්ෂය සඳහා රුපියල් 50.00 බැගින්වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනවලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යැයි ද මීගහකිවුල ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය."

(ඈ) එකී පනතේ 134 (07) වගන්තිය ප්‍රකාර පහත සඳහන් පරිදි බදු මුදල් ගෙවනු ලබන ආකාරය අනුව වට්ටම් ප්‍රදානය කරනු ලබන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

මුළු වර්ෂයේ ම බදු මුදල ජනවාරි මස 31 වැනි දින ඉකුත්වීමට මත්තෙන් ගෙවන්නේ නම් නියමිත බදු මුදලින් 10%ක වට්ටමක් ලබා දෙනු ලබන බවටත්,

බදු මුදල කාර්තු වශයෙන් ගෙවනු ලබන අවස්ථාවල දී බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමු වැනි මාසය තුළ ගෙවන්නේ නම් 5% ක වට්ටමක් ලබා දිය යුතු බව තීරණය කරමි.

10-33/8

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කසල එක්රැස් කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම

1987/අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 2012.10.05 දින අංක 1778/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) කොටසේ පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පලකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රාදේශීය සභා කොටසේ ඝණ අප ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කසල එක්රැස් කිරීම වෙනුවෙන් උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2025 වර්ෂය සඳහා අයකළ යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/320 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(අ) හා 122-126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව 2012.10.05 දින අංක 1778/45 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (අ) කොටසේ පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාත් ගරු ප්‍රධාන ඇමතිතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ ප්‍රාදේශීය සභා කොටසේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව අතුරු ව්‍යවස්ථා විධිවිධාන ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කසල එක්රැස් කිරීම වෙනුවෙන් උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2025 වර්ෂය සඳහා අයකර ගැනීමට තීරණය කරමි.

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 01. | කරමැටිය මැලිබන් ඇගලුම් කර්මාන්ත ශාලාවේ කසල ඉවත් කිරීම සඳහා ට්‍රැක්ටරය රථය ලබා ගැනීමේ එක් අවස්ථාවක් සඳහා | 10,000 0 |
| 02. | කරමැටිය ප්‍රීමා පිටි කම්හලෙන් බැහැර කරන කසල 1Kg - 40 Kg. දක්වා | 1,250 0 |

- වැඩිවන සෑම 1 Kg සඳහා පෙර වටිනාකම අනුපාතික වටිනාකමක් වශයෙන් ගාස්තු අය කරේ. (1500/40)

10-33/9

---

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයේ ජල ගාස්තු අය කිරීම

මීගහකිවුල ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන ජල ව්‍යාපෘති මගින් ජලය ලබා ගන්නා පාරිභෝගිකයන් වෙතින් පහත තීරණයේ සඳහන් ගාස්තු ප්‍රමාණයෙන් 2025 වර්ෂය සඳහා අය කිරීමට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/321 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත ව්‍යවස්ථා පනතේ අංක 02 යටතේ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා විසින් සාදනු ලැබ 1988.08.23 දිනැති අංක 520/07 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ*IV (අ) කොටසේ පළ කරන ලද්දා වූ පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 34 දරන කාණ්ඩය වන ජල සම්පාදන පනතේ වූ අංක 40 සිට අංක 43 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවල සඳහන් පරිදි පහත සඳහන් උපලේඛන 01 හා උපලේඛන 02 හි සඳහන් අයුරින් හා අනෙකුත් ජල අයකිරීම් මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජල සම්පාදන ක්‍රමවලින් 2025.01.01 වැනි දින සිට ජල ගාස්තු අයකරගැනීමට තීරණය කරමි.

**උපලේඛන අංක 01 - ගාස්තු අය කිරීම**

මීගහකිවුල හා හෙලමල්වත්ත ජල යෝජනා ක්‍රමය

| *අනු. අංකය* | *ගාස්තු ඒකක (ඝන මීටර්)* | *ගෘහ සම්බන්ධතා හා රජයේ ආයතන සඳහා* | | *ව්‍යාපාරික සහ අනෙකුත් ආයතන සඳහා* | |
|---|---|---|---|---|---|
| | | *ස්ථාවර ගාස්තු රුපියල්* | *ඒකකයකට රුපියල්* | *ස්ථාවර ගාස්තු රුපියල්* | *ඒකකයකට රුපියල්* |
| 01 | 0-05 දක්වා | 250 0 | 20 0 | 350 0 | 19 0 |
| 02 | 06-10 දක්වා | 300 0 | 20 0 | 400 0 | 19 0 |
| 03 | 11-15 දක්වා | 350 0 | 25 0 | 450 0 | 24 0 |
| 04 | 16-20 දක්වා | 400 0 | 30 0 | 500 0 | 29 0 |
| 05 | 21-25 දක්වා | 425 0 | 35 0 | 525 0 | 34 0 |
| 06 | 26-30 දක්වා | 450 0 | 40 0 | 550 0 | 39 0 |
| 07 | 31- 35 දක්වා | 475 0 | 45 0 | 575 0 | 44 0 |
| 08 | 36 හෝ 36ත් ඉහළට | 500 0 | 50 0 | 600 0 | 49 0 |

**උපලේඛන අංක 02 - ගාස්තු අය කිරීම**

10 කණුව, තල්දෙන ජල යෝජනා ක්‍රමය

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | 0-10 දක්වා | 175 0 | 15 0 | 300 0 | 19 0 |
| 02 | 11-15 දක්වා | 225 0 | 20 0 | 300 0 | 24 0 |
| 03 | 16-20 දක්වා | 225 0 | 25 0 | 350 0 | 29 0 |
| 04 | 21-25 දක්වා | 250 0 | 30 0 | 350 0 | 34 0 |
| 05 | 26-30 දක්වා | 250 0 | 35 0 | 350 0 | 39 0 |
| 06 | 31-35 දක්වා | 250 0 | 40 0 | 350 0 | 44 0 |
| 07 | 36 හෝ 36ත් ඉහළට | 250 0 | 45 0 | 350 0 | 49 0 |

**උපලේඛනය අංක 03 - ගාස්තු අය කිරීම**

වෙලන්ලන්ද/කෙසෙල්වත්ත/කෝමාරික /ලිහිණියාකැටිය/තල්දෙන අරුකුඹුර ජල යෝජනා ක්‍රමය

| *අනු. අංකය* | *ගාස්තු ඒකක (ඝන මීටර්)* | *ගෘහ සම්බන්ධතා හා රජයේ ආයතන සඳහා* | | *ව්‍යාපාරික සහ අනෙකුත් ආයතන සඳහා* | |
|---|---|---|---|---|---|
| | | *ස්ථාවර ගාස්තු රුපියල්* | *ඒකකයකට රුපියල්* | *ස්ථාවර ගාස්තු රුපියල්* | *ඒකකයකට රුපියල්* |
| 01 | 0-10 දක්වා | 175 0 | 15 0 | 300 0 | 20 0 |
| 02 | 11-15 දක්වා | 225 0 | 20 0 | 300 0 | 25 0 |
| 03 | 16-20 දක්වා | 225 0 | 25 0 | 350 0 | 30 0 |
| 04 | 21-25 දක්වා | 250 0 | 30 0 | 350 0 | 35 0 |
| 05 | 26-30 දක්වා | 250 0 | 35 0 | 350 0 | 40 0 |
| 06 | 31-35 දක්වා | 250 0 | 40 0 | 350 0 | 45 0 |
| 07 | 36 හෝ 36න් ඉහළට | 250 0 | 45 0 | 350 0 | 50 0 |

ජල සේවා සඳහා ගාස්තු අයකිරීම් :

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 01. | ජල අයදුම්පතක් සඳහා ගාස්තු | 250.00 |
| 02. | ජල මීටරය සඳහා ගාස්තු | 7,500 0 |
| 03. | නව ජල සම්බන්ධතාව ලබා ගැනීමේ දී තැන්පත් ගාස්තු | 5,000 0 |
| 04. | ජල බදු ලේඛනයේ නම සංශෝධනය කිරීමේ අයදුම්පත් ගාස්තු | 300 0 |
| 05. | ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය කර ඇති එක් අවස්ථාවක ගාස්තු අයකිරීම | 5,000 0 |

නව ජල සම්බන්ධතාවක් ලබාගැනීම සඳහා අයකරනු ලබන ගාස්තු :

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 01. | ගෘහස්ථ හා රාජ්‍ය ආයතන | 10,000.00 |
| 02. | ව්‍යාපාර | 12,000.00 |

**සැලකිය යුතුයි :**

- නව ජල සම්බන්ධතාව ලබාගැනීමේ දී ප්‍රධාන නලයේ සිට සේවා සපයන නලය ලබාදීමට අවශ්‍ය සම්බන්ධතා උපාංගය, PVC අඟල් 1/2 එක් නලයක් (දිග 4m) සම්බන්ධතා ගාස්තුවට අදාළ වේ.
- ජල මීටරය ප්‍රාදේශීය සභාව තුළින්ම ලබා ගත යුතු ය.
- නව ජල සම්බන්ධතාව ලබාගැනීමේ දී ප්‍රධාන නලයට සම්බන්ධිත දිග 4m වන PVC නලයේ සිට සේවා සපයන නලය ලබා දීමට අවශ්‍ය සම්බන්ධතා නල සහ උපාංග (මීටරය රහිතව), ජල මීටර් කණුව ද පාරිභෝගිකයා විසින් සපයා ගත යුතුය. එසේ නොවේ නම් සභාව විසින් ඉදිරිපත් කරන ඇස්තමේන්තු ගත මුදල පාරිභෝගිකයා විසින් ගෙවිය යුතු ය.

විසන්ධි කර ඇති ජල සම්බන්ධතා නැවත ලබාදීමේ ගාස්තු :

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | නිවාස/රජයේ ආයතන | 3,000.00 |
| 02. | වෙනත් (ව්‍යාපාර) | 5,000.00 |

පිරිපහදු කළ ජලය සඳහා ගාස්තු අය කිරීම:

* පිරිපහදු කළ ජලය ලීටර් 01ක් සඳහා 4.00

10-33/10

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම මත ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර, 1988.08.23 දින අංක 520/07 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv(අ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථාවේ හා නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/322 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව,

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21, 49, 78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/07 දරන පළාත් පාලන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථාවේ හා නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු අයකිරීමට තීරණය කරමි.

**උපලේඛනය**

01. මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය හා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම

ඉදිකිරීම් සම්බන්ධ :

| | *රු. ශත* |
|---|---|
| 1. අයදුම්පත් ගාස්තුව | 300.00 |
| 2. පෙරසැරි ගාස්තුව : | |
| * නේවාසික ගොඩනැගිලි | 2,500 0 |
| * වාණිජ හා වෙනත් ගොඩනැගිලි | |
| * කුඩා පරිමාණ | 5,500 0 |
| * මධ්‍ය පරිමාණ | 6,500 0 |
| * මහා පරිමාණ | 8,000 0 |
| 3. මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදි කිරීම | 1,500 00 |
| 4. දුරකථන විදුලි සංදේශ කුළුණු | 10,000 00 |

02. ගොඩනැගිලි ඉදිකිරීම/කොටසක් එකතු කිරීම/ගෙබිමේ විශාලත්වය පදිංචිය සඳහා වාණිජ හෝ වෙනත් නැවත ඉදිකිරීමක් සඳහා සංවර්ධන බලපත්‍ර වර්ග මීටර්වලින් භාවිත නිකුත්කිරීම රුපියල් ශතවලින්

| *ගෙබිමේ විශාලත්වය වර්ග මීටර් වලින්* | *පදිංචිය සඳහා රු. ශත* | *වාණිජ හෝ වෙනත් භාවිත රු. ශත* |
|---|---|---|
| 45ට අඩු | 600 0 | 2,000 0 |
| 45-90 දක්වා | 1,600 0 | 2,500 0 |
| 91-180 දක්වා | 2,600 0 | 3,500 0 |
| 181-270 දක්වා | 3,600 0 | 4,500 0 |
| 271-450 දක්වා | 4,600 0 | 6,500 0 |
| 451-675 දක්වා | 5,600 0 | 8,500 0 |
| 676-900 දක්වා | 6,600 0 | 10,500 0 |
| 901-1,225 දක්වා | 7,600 0 | 12,500 0 |

ව. මී. 90ක් වන එක් එක් අමතර ගෙබිම් ප්‍රමාණය රු. 1,000.00 බැගින් ව. මී. 90ක් වන ගෙබිම් ප්‍රමාණය සඳහා රු. 1,500.00 බැගින්,

- මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම

| *මායිම් තාප්පය ඉදිකිරීමේ සීමාව* | *මායිම් තාප්පයේ දිග මීටර් එකක් සඳහා ගාස්තුව* | |
|---|---|---|
| | *නේවාසික රු. ශ.* | *වාණිජ හා වෙනත් වර්ග රු. ශ.* |
| ගොඩනැගිලි සීමාව පිටත | 40 0 | 50 0 |
| ගොඩනැගිලි සීමාව ඇතුළත | 60 0 | 70 0 |

- දුරකථන විදුලි සංදේශ කුළුණු

| *පෙරසැරි ගාස්තු* | *රු. ශත.* |
|---|---|
| උස මීටර් 0-20 දක්වා | 300,000 0 |
| උස මීටර් 20-50 දක්වා | 400,000 0 |
| උස මීටර් 50ට වැඩි | 600,000 0 |
| ආවරණ අනුමැතිය සඳහා ගාස්තු | |
| උස සෑම මීටර් 5කට | 20,000 0 බැගින් |

සංවර්ධන බලපත්‍ර අලුත් කිරීම - වර්ෂයකින් කාලය දීර්ඝ කිරීම - රු. 1,000 00
(සංවර්ධන බලපත්‍රය වර්ෂයක් පාසා දීර්ඝ කළ යුතු ය.)

03. නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ඉදිකිරීම /කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම සඳහා ආවරණ අනුමැතිය දීමේ ගාස්තු/මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම හා දුරකථන විදුලි සංදේශන කුළුණු සඳහා ගාස්තු :

| | | *නේවාසික වර්ග මීටර් 1ක් සඳහා ගාස්තුව රු. ශත* | *වාණිජ හා වෙනත් වර්ග මීටර් 1ක් සඳහා ගාස්තු රු. ශත* |
|---|---|---|---|
| 1. | අත්තිවාරම් වැඩ පමණක් (කයිරු මට්ටම් සම්පූර්ණ කොට ඇති විට) | 200 0 | 250 0 |
| 2. | වහල මට්ටම දක්වා (වහලය රහිතව ඉදිකොට ඇති විට) | 300 0 | 350 0 |

| | | *නේවාසික වර්ග මීටර් 1ක් සඳහා ගාස්තුව රු. ශත* | *වාණිජ හා වෙනත් වර්ග මීටර් 1ක් සඳහා ගාස්තුව රු. ශත* |
|---|---|---|---|
| 3. | වහලය ඇතුළුව ඉදිකොට ඇතිවිට | 400 0 | 450 0 |
| 4. | සම්පූර්ණයෙන් ඉදිකොට ඇතිවිට | 500 0 | 550 0 |
| 5. | මායිම් තාප්ප දිග මී. 1ක් සඳහා | 30 0 | 60 0 |
| 6. | දුරකථන, විදුලි සංදේශන කුළුණු : | | |
| | ➢ 0-30 අතර | 100,000 0 | |
| | ➢ 30-60 අතර | 150,000 0 | |
| | ➢ 60ට වැඩි | 200,000 0 | |

| | |
|---|---|
| 04. අනුකූලතා සහතිකය ලබා ගැනීම සඳහා : | *රු. ශත* |
| ➢ ගෘහස්ත | 3,000 0 |
| ➢ වාණිජ : | |
| කුඩා | 4,000 0 |
| මධ්‍යම | 6,000 0 |
| විශාල | 10,000 0 |
| අයදුම්පතක් සඳහා : | 150 0 |

| | | |
|---|---|---|
| 05. පිඹුරුපත අනුමත කිරීමේ : | *රු. ශත* | |
| අයදුම්පතක් සඳහා | 200 0 | |
| පිඹුරුපත අනුමත කිරීමේ ගාස්තු : | | |
| ව. මී. 1,000 ට අඩු ඉඩම් සඳහා | 2,500 0 | |
| ව. මී. 1,001 - 5,000 දක්වා | 5,200 0 | |
| ව. මී. 5,001 - 10,000 දක්වා | 10,200 0 | බැගින් |
| ව. මී. 10,001 ට වැඩි සෑම ව. මී. 1,000 කටම | 1,200 0 | බැගින් |

| | |
|---|---|
| 06. ඉඩම් අනුබෙදුම් කට්ටියක් අනුමත කිරීම සඳහා ගාස්තු | *රු. ශත* |
| අයදුම්පත් ගාස්තුව | 200 0 |

| *සංවර්ධන කාර්යයේ ස්වභාවය* | | *අයකළ යුතු ගාස්තු රු. ශත* |
|---|---|---|
| (i) ඉඩම් අනු කොටස්වලට බෙදීම සඳහා සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම | බිම් කට්ටියක ප්‍රමාණය | එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර) |
| (ii) ආවරණ අනුමැතිය සඳහා | ව. මී. 150-300 අතර | 600 0 |
| | ව. මී. 301-600 අතර | 500 0 |
| | ව. මී. 601-900 අතර | 400 0 |
| | ව. මී. 901ට වැඩි | 300 0 |
| | එක් බිම් කොටසකට | 850 0 |

| | |
|---|---|
| 07. වීථිරේඛා සහතිකය සඳහා | 3,000 0 |
| අයදුම්පතක් සඳහා | 150 0 |

| | | | |
|---|---|---|---|
| | | | *රු. ශත* |
| 08. | නොපවරා ගැනීමේ සහතිකය සඳහා | | 1,500 0 |
| | අයදුම්පතක් සඳහා | | 150 0 |
| 1 | ඉඩම්/කුඹුරු ගොඩකිරීම සඳහා | | |
| | | ව. මී. 150 ට අඩු ඉඩම් සඳහා | 2,600 0 |
| | | ව. මී. 151-300 දක්වා | 5,100 0 |
| | | ව. මී. 301ට වැඩි වන සෑම ව. මී. 150 කටම | 3,100 0 |
| | | ආවරණ අනුමැතිය සඳහා ගාස්තු | |
| | | සෑම වර්ග මීටරයකටම | 5,500 0 බැගින් |

10-33/11

---

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර වෙනුවෙන් ගාස්තු අය කිරීම

මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හා කර්මාන්ත සඳහා පාරිසරික බලපත්‍රය ලබා ගැනීමට අදාළව පහත උපලේඛනයේ දැක්වෙන පරිදි 2025 වර්ෂය සඳහා ගාස්තු අයකිරීමට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/323 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,  
සභා ලේකම්,  
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,  
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

### තීරණය

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වැනි වගන්තිය යටතේ සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1553/16 දරන වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 25 දිනැති *ගැසට් පත්‍රයේ*(ඇ) උපලේඛනයෙන් හා 2008 ක් වූ පෙබරවාරි මස 01 දිනැති අංක 1534/18 දරන *ගැසට් පත්‍රයේ* හා 2264/18 දරන වර්ෂ 2022ක් වූ ජනවාරි මස 27 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (ඇ) කොටසේ සඳහන් පරිදි පැවරී ඇති බලය අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආරම්භ කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හා කර්මාන්ත සඳහා එකවර වසර 03 ක කාල පරිච්ඡේදයක් සඳහා රු. 4,500.00 ක් වූ පරිසර බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට තීරණය කරමි.

එසේම පරිසර බලපත්‍ර සඳහා වන පරීක්ෂණ ගාස්තු පහත පරිදි ගෙවිය යුතුය.:

| *මූලික ආයෝජනය* | *පරීක්ෂණ ගාස්තු රු. ශත* |
|---|---|
| රු. 250,000.00 දක්වා | 3,000.00 |
| රු. 250,001.00 - රු. 500,000.00 දක්වා | 3,750.00 |
| රු. 500,001.00 - රු. 1,000,000.00 දක්වා | 5,000.00 |
| රු. 1,000,000.00 ට වැඩි | 10,000.00 |
| අයදුම්පත් ගාස්තු : | 200.00 |

10-33/12

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

මීගහකිවුල ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු පැනවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි 2025 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/324 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 153 (1) වැනි වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක

(1) එම ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති නම් හෝ,

(2) එම ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

(3) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති ප්‍රමාණය 1/20ට වඩා අඩුවන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීම සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2025 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ, භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට 0.1% ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2025 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළ යුතු යැයි තීරණය කරමි.

10-33/13

---

## මීගහකිවුල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා යන්ත්‍රෝපකරණ කුළියට දීමේ ගාස්තු අය කිරීම

මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු යන්ත්‍රෝපකරණ කුළියට දීම සම්බන්ධයෙන් පහත උපලේඛනයේ දැක්වෙන පරිදි 2025 වර්ෂය සඳහා ගාස්තු අයකිරීමට, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/325 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

2025 වර්ෂය සඳහා මීගහකිවුල ප්‍රාදේශීය සභාව සතු පහත උපලේඛනයේ සඳහන් වාහන යන්ත්‍රෝපකරණ සේවාවන් සැපයීම සම්බන්ධයෙන් ඊට අනුරූපිත තීරුවේ සඳහන් ගාස්තු පනවා අය කිරීමට තීරණය කරමි.

**උපලේඛනය**

**වාහන කුලිය සඳහා ගාස්තු**

| *අනු. අංකය* | *වාහනය/යන්ත්‍රය* | *මිල (රු. ශත) (දිනකට / පැයකට/දින 1/2)* | | *රැඳවුම් ගාස්තුව රු. ශත.* |
|---|---|---|---|---|
| 01. | බැකෝ ලෝඩරය | ඉන්ධන සහිතව පැයකට | 5,700 0 | දිනකට 5,800 0 |
| | | ඉන්ධන රහිතව පැයකට | 3,800 0 | |
| 02. | ටොන් 08 ගල් රෝල | ඉන්ධන සහිතව පැයකට | 5,000 0 | දිනකට 5,100 0 |
| | | ඉන්ධන රහිතව පැයකට | 2,500 0 | |
| 03. | ටොන් 02 ගල් රෝල | ඉන්ධන සහිතව පැයකට | 2,900 0 | දිනකට 3,000 0 |
| | | ඉන්ධන රහිතව පැයකට | 1,500 0 | |
| 04. | ට්‍රැක්ටරය රථය (ටේලරය සහිතව) | ඉන්ධන සහිතව දිනකට | 11,550 0 | දිනකට 2,500 0 |
| | | ඉන්ධන රහිතව දිනකට | 4,800 0 | |
| | ට්‍රැක්ටරය රථය දින 1/2 සඳහා (පැය 04ක්) | ඉන්ධන සහිතව | 5,750 0 | |
| | | ඉන්ධන රහිතව | 2,400 0 | |
| | ට්‍රැක්ටරය රථය (බවුසරය සහිතව, මෝටරය රහිතව) | ඉන්ධන සහිතව දිනකට | 11,550 0 | |
| | | ඉන්ධන රහිතව දිනකට | 4,800 0 | |
| | ට්‍රැක්ටරය රථය (බවුසරය සහිතව, මෝටරය සහිතව) | ඉන්ධන සහිතව දිනකට | 12,550 0 | |
| | | ඉන්ධන රහිතව දිනකට | 5,300 0 | |
| 05. | ජල බවුසරය, ට්‍රැක්ටරය සහිතව | ජලය රහිතව කි. මී. 5 ඇතුළත එක් වරකට | 1,300 0 | 1,000 0 (ට්‍රැක්ටරය රහිතව) |
| | | ජලය සහිතව කි. මී. 5 ඇතුළත එක් වරකට | 4,300 0 | |
| | | වැඩිවන අමතර කි. මී. 1 සඳහා | 200 0 | |
| | ජල බවුසරය (ට්‍රැක්ටරය රහිතව) | ඉන්ධන රහිතව දිනකට (ව්‍යාපෘති සඳහා) | 1,250 0 | |
| | ටේලරය (ට්‍රැක්ටරය රහිතව) | | | |
| 06 | ටිපර් රථය | ඉන්ධන සහිතව දිනකට (උපරිම කි. මී. 70) | 23,000 0 | |
| | | වැඩිවන අමතර කි. මී. 1 සඳහා | 270 00 | |
| | | ඉන්ධන රහිතව දිනකට (උපරිම කි. මී. 70) | 10,000.00 | |
| | | වැඩිවන අමතර කි.මී. 1 සඳහා | 55.00 | |
| 07 | පස් තලන යන්ත්‍රය | ඉන්ධන රහිතව දිනකට (යන්ත්‍ර ක්‍රියාකරු සමඟ) | 5,000 0 | |
| | | ඉන්ධන රහිතව දින 1/2 (පැය 04ක්) සඳහා (යන්ත්‍ර ක්‍රියාකරු සමඟ) | 2,500 0 | |

| අනු. අංකය | වාහනය/යන්ත්‍රය | මිල (රු. ශත) (දිනකට / පැයකට/දින 1/2) | | රැඳවුම් ගාස්තුව රු. ශත. |
|---|---|---|---|---|
| 08 | කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය | ඉන්ධන රහිතව දිනකට (යන්ත්‍ර ක්‍රියාකරු සමග) | 8,500 0 | |
| | | ඉන්ධන රහිතව දිනකට (යන්ත්‍ර ක්‍රියාකරු නොමැතිව) | 6,000 0 | |

(ඉන්ධන මිල විචලනයක් සිදු වුවහොත් ඉහත ගාස්තු සංශෝධනය කිරීම සභාව සතු වේ.)

10-33/14

---

**මීගහකිවුල ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා සහතිකපත් හා වෙනත් සේවා ගාස්තු අය කිරීම

මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් මහ ජනතාව වෙත සපයනු ලබන සේවාවන් වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2025.01.01 වැනි දින සිට අයකරනු ලබන බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2024 වර්ෂයේ අගෝස්තු මස 15 වැනි දින තීරණ අංක 2024/08/15/326 දරන තීරණය මගින් තීරණය කර ඇති බැව් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. .

ඩී. එම්. කේ. ඩී. දිසානායක,
සභා ලේකම්,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මීගහකිවුල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

මීගහකිවුල ප්‍රාදේශීය සභාව මගින් සිදුකරනු ලබන සේවාවන්හි දී 2025 වර්ෂයේ දී නිකුත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර, සහතික, දැන්වීම් හා අවසර පත්‍ර සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ගාස්තු පහත සඳහන් ආකාරයට අය විය යුතු බව තීරණය කරමි.

**උපලේඛනය**

| | වර්ගය | ගාස්තුව රු. ශත |
|---|---|---|
| | *පුස්තකාල* | |
| 01 | පුස්තකාල සාමාජික ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 50 0 |
| 02 | පුස්තකාල සාමාජික ගාස්තුව (නව අයදුම්කරුවකු සඳහා) | |
| | * අවුරුදු 6 සිට 12 දක්වා ළමුන් සඳහා | 100 0 |
| | * අවුරුදු 12 සිට වැඩිහිටි ළමුන් සඳහා | 200 0 |
| | * වැඩිහිටි අංශයේ සාමාජික මුදල (බල සීමාව තුළ පදිංචි) | 250 0 |
| | * වැඩිහිටි අංශයේ සාමාජික මුදල (බල සීමාවෙන් පිටත පදිංචි) | 300 0 |
| 03 | පුස්තකාල දඩ (දිනකට) | 5 0 |
| 04 | පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම (වාර්ෂික) | |
| | * පාසල් සිසුන් | 100 0 |
| | * වැඩිහිටියන් | 150 0 |

| *වර්ගය* | *ගාස්තුව රු. ශත* |
|---|---|
| **පෙර පාසල් :** | |
| 01. පෙර පාසල සඳහා ඇතුළත් වීමේ අයදුම්පත් ගාස්තු | 100 0 |
| 02. පෙර පාසල සඳහා ළමුන් ඇතුළත් වීමේ ගාස්තු | 2,000 0 |
| **වෙනත් :** | |
| 01. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා පොදු රැස්වීමක් සඳහා නගර සීමාව භාවිතා කිරීම | 3,000 0 |
| 02. අලෙවි ප්‍රවර්ධන වැඩසටහන්, පොදු රැස්වීම් හා වෙනත් සඳහා මීගහකිවුල සතිපොළ ගොඩනැගිල්ලේ | |
| උඩු මහල සඳහා | 4,000 0 |
| බිම් මහල සඳහා | 3,500 0 |
| 03. කරමැටිය පොළ භූමිය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා පොදු රැස්වීමක් සඳහා ඉඩම වෙන් කර ගැනීම සඳහා | 4,000 0 |
| 04. තල්දෙන පොළ භූමිය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් හා පොදු රැස්වීමක් සඳහා ඉඩම වෙන්කර ගැනීම සඳහා | 4,000 0 |
| 05. නව බස් නැවතුම්පල භූමිය කුළියට දීම | සභාව සතු භූමියක වර්ග අඩියක් සඳහා එක් දිනකට රු. 5/- |

**06. රථ වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම :**

| | *රු. ශත* |
|---|---|
| * ත්‍රිරෝද රථ සඳහා | 40 0 |
| * වෑන් රථ/කාර් රථ සඳහා | 50 0 |
| * බස් රථ/ලොරි රථ සඳහා | 100 0 |
| * වෙනත් | 60 0 |

07. පිටමාරුව පුංචි ලෝකාන්තය නැරඹීම සඳහා ප්‍රවේශපත්‍ර ලබා ගැනීම :

| | *රු. ශත* |
|---|---|
| * සියළුම සංචාරකයින් සඳහා | 50 0 |
| • **කූඩාරම, ලන්තෑරුම හා BBQ Machine** එක (එක් රාත්‍රියක් සඳහා) : | |
| * පුද්ගලයින් 04ක් සඳහා කූඩාරම (Double Layer auto) | 750 0 |
| * පුද්ගලයින් 06ක් සඳහා කූඩාරම (Double Layer auto) | 1,000 0 |
| * පුද්ගලයින් 04ක් සඳහා කූඩාරම, ලන්තෑරුම (භූමිතෙල් රහිතව) සමඟ (BBQ Machine) (ලොකු) | 1,100 0 |
| * පුද්ගලයින් 06ක් සඳහා කූඩාරම, ලන්තෑරුම (භූමිතෙල් රහිතව) සමඟ (BBQ Machine) (ලොකු) | 1,300 0 |
| (BBQ Machine) (ලොකු) | 300 0 |
| * ප්‍රමාද ගාස්තු දිනකට රු. 100.00 | |

**නිෂ්පාදනය හා ප්‍රවාහනය මත ගාස්තු අය කිරීම**

| | |
|---|---|
| 01. කළුගල් හා හුණුගල් කැඩීම වෙනුවෙන් සෑම කියුබ් 01 ක් සඳහාම | 100 0 |
| 02. තිරුවානා ගල් කැඩීම වෙනුවෙන් සෑම කියුබ් 01 ක් සඳහාම | 150 0 |
| 03. කුඩා විදුලි බලාගාරවල නිෂ්පාදනය කරනු ලබන විදුලි ඒකක 01 ක් සඳහා (ප්‍රධාන විදුලි පද්ධතියට එක් කරන) | 0 25 |
| 04. මීගහකිවුල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වැලි වලකින් ගොඩ දමන වැලි කියුබ් 01 ක් සඳහා | 40 0 |
| 05. වැලි වලේ සිට ප්‍රවාහනය කරන වැලි කියුබ් 01 ක් සඳහා | 60 0 |

10-33/15

## ගිරිබාව ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යයන් ඉටුකරන ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එච්. එම්. එස්. හේරත් වන මම එකී පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.09.09 දිනැති තීරණ අංක 2019 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එස්. හේරත්,
ලේකම්,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් ම එම උපලේඛනයෙහි II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර එම බදු මුදල ගිරිබාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි."

*උපලේඛනය*

| *අනු. අංකය* | *I වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* |
| 01. | පොල්ලෙලි කැබලි (කටර්) කිරීමේ කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | සිසිල් බීම නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | අභ්‍යාස පොත් නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | ප්ලාස්ටික් වතුර ටැංකි නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | වතුර බෝතල් නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | විදුලි උපාංග නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | පාවහන් නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | මැටි වළං නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ඇඟළුම් කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | සහල් නිෂ්පාදන කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | සේදුම් දියර නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ලී කැටයම් කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | රබර් ආශ්‍රිත අත් ආවරණ නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | I වැනි තීරුව | II වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | ස්ථානයේ වාර්ෂික වටිනාකම | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත | රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත | රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත |
| 14. | සෙල්ලම් බඩු නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | සංගීත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | බිම්මල් නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | පොල් ලෙලි කපන යන්ත්‍ර නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | හඳුන්කූරු නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | විදුලි බුබුළු නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | මදුරු දැල් නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | මෙට්ටා නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | පසාරු කැටයම් කිරීමේ නිපදවීමේ කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | කොසු, ඉදල්, ලණු නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | රෙදි පාපාසි හා ලණු පාපිසි නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | බෑග් නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ගල් ස්මාරක නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | සුර නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | පහන්තිර නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | පපඩම් නිෂ්පාදන කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |

10-15/1

---

## ගිරිබාව ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යයන් ඉටුකරන ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එච්. එම්. එස්. හේරත් වන මම එකී පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව 2024.09.09 දිනැති තීරණ අංක 2020 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එස්. හේරත්,<br>
ලේකම්,<br>
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,<br>
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී බද්දට යටත් යම් තැනැත්තෙකු 2025 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගිරිබාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට මම තීරණය කරමි."

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| *බද්ද අදාළවන වර්ෂයට පෙර ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *ගෙවිය යුතු බද්ද*<br>*රු. ශත.* |
| 01. රු.6,000.00 නොඉක්මවන අවස්ථාව | නැත |
| 02. රු.6,000.00 ඉක්මවන නමුත් රු.12,000.00 නොඉක්මවන විට | 90 0 |
| 03. රු.12,000.00 ඉක්මවන නමුත් රු.18,750.00 නොඉක්මවන විට | 180 0 |
| 04. රු.18,750.00 ඉක්මවන නමුත් රු.75,000.00 නොඉක්මවන විට | 360 0 |
| 05. රු.75,000.00 ඉක්මවන නමුත් රු.150,000.00 නොඉක්මවන විට | 1,200 0 |
| 06. රු.150,000.00 ඉක්මවන විට | 3,000 0 |

10-15/2

---

**ගිරිබාව ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යයන් ඉටුකරන ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එච්. එම්. එස්. හේරත් වන මම එකී පනතේ 147 හා 149 වන වගන්තිවල විධිවිධාන ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.09.09 දිනැති තීරණ අංක 2021 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එස්. හේරත්,
ලේකම්,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක හෝ ගිරිබාව ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ මෙහි පහත උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2025 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට ද,

තව ද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපනශාලාවක්, නවාතැන්පලක්වන විට දී ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2024 වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුවක් ලෙස 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් මම තීරණය කරමි.

**උපලේඛනය අංක 01**

| *අනු. අංකය* | *I වන තීරුව* | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* |
| 1. | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා) | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුලු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | කරවල, ලුණු මාළු හෝ ජාඩි කි. ග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | දුම්කොළ වියළීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | සත්ත්ව ආහාර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | සබන් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | අලුත් ලෝහ හා පරණ ලෝහ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ලෝහ සුන්බුන් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ගෘහ භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | වේවැල් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | සිරප් හෝ පළතුරු බීම නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | රස කැවිලි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම) | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර) | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | දත් බුරුසු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | රා එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | විනාකිරි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | *I වන තීරුව* | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* |
| 24. | දූව ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | කෙඳි සායම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | පළතුරු, මාලු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම හා පැකට් කර අලෙවිය | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | බේකින් පවුඩර් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | පොටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ඉටිපන්දම් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | රෙදි සෝදන නිල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | සුවඳ විලවුන් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | පාසල් රටහුණු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ටයර් හෝ ටියුබ් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | ටයර් නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ටයර්, ටියුබ් වොල්කනයිසින් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | සිමෙන්ති නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 41 | වැලි කඩදාසි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | ගඩොල් පිළිස්සීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | යන්ත්‍රෝපකරණයෙන් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | උළු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | තේ කොළ පැකට් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | කුළුබඩු වර්ග පැකට් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | කෑමට ගන්නා හුණු නිපදවීම හා විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | බයිට් වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | ජල පිල්ටර් | 500 0 | 750 0 | 1,000 0 |

**උපලේඛනය අංක 02**

අන්තරාදයක ව්‍යාපාර

| අනු. අංකය | *I වන තීරුව* | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* |
| 1. | කලුගල් කැනීම හෝ කැඩීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | එළවලු තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | පොල් තෙල් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | තේ පෙට්ටි නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | පිදුරු තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ලබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | විසිරි පින්තාරු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ආයුර්වේද බෙහෙත් ඖෂධ තෙල් වර්ග නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | වැලි ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

**උපලේඛනය අංක 03**

අප්‍රසන්න හා අන්තරාදයක ව්‍යාපාරඃ

| අනු. අංකය | *I වන තීරුව* | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල* <br> *රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල* <br> *රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල* <br> *රු. ශත* |
| 1. | රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | ගිණිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | ලෝහ වර්ග පැස්සවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | මෝටර් වාහන අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | මෝටර් වාහන සේවා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | බෙලෙක් වැඩ පළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | මෝටර් වාහන බොඩි තැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | කෘමිනාශක, දිලීර නාශක, පැළෑටි නාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | විෂබීජ නාශක නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | කොම්පෝස්ට් පොහොර නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |

**උපලේඛනය අංක 04**

1988.08.23 වැනි දින දරන 520/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් සම්මත අතුරු ව්‍යවස්ථාවන්ට අනුව බලපත්‍ර ලැබිය යුතු ව්‍යාපාර

| *අනු. අංකය* | *I වන තීරුව* | *II වන තීරුව* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තයේ ස්වභාවය* | *ස්ථානයේ වාර්ෂික වටිනාකම* | | |
| | | *රු. 750 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* | *රු. 1,500 ඉක්මවන අවස්ථාවක උපරිම බදු මුදල රු. ශත* |
| 1. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | තේ සහ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | කොණ්ඩා සැකසීමේ සැලුන්හල් සහ බාබර් සාප්පුවක් | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | මස් විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | කිරිපට්ටි හා කිරි වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | උකස් ලියාපදිංචි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | සිසිල්බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ගවගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | පොදු වෙළඳ පොළවල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ආහාර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ලගුම් නිවාස | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | සංචාරක වෙළෙන්දෝ | 500 0 | 750 0 | 1,000 0 |

10-15/3

---

**ගිරිබාව ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, ගිරිබාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යයන් ඉටුකරන ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එච්. එම්. එස්. හේරත් වන මම එකී පනතේ 148 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වාහන හා සත්ත්ව බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.09.09 දිනැති තීරණ අංක 2022 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එකී වාහනය හෝ සතා තමාගේ භාරයේ තබා ගන්නා දින ගණන දින 30ක් සම්පූර්ණ වූ වහාම 2025 වර්ෂය සඳහා වන මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතුය.

එච්. එම්. එස්. හේරත්,
ලේකම්,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ 3 වන උපවගන්තිය සමග කියවිය යුතු එම පනතේ 148 වැනි වගන්තියෙන් මා වෙ පැවරී ඇති බලතල ප්‍රකාරව, ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ තබාගෙන තිබෙන යම් වාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් බද්දක් පනවා අය කිරීමටත්, ඒ බද්ද 2025 අප්‍රේල් මස 30 දිනට පෙර ගිරිබාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් මම තීරණය කරමි.

*උපලේඛනය*

| | *I වැනි තීරුව* | *II වැනි තීරුව රු. ශත* |
|---|---|---|
| (01) 1. | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25 0 |
| 2. | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා - | |
| | (අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | (ආ) වෙළෙඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |

(02) විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

10-15/4

---

**ගිරිබාව ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යයන් ඉටුකරන ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එච්. එම්. එස්. හේරත් වන මම එකී පනතේ 152 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව, ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ පොදු ස්ථාන ඇති කිරීම සඳහා ගාස්තුව නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව 2024.09.09 දිනැති තීරණ අංක 2023 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එස්. හේරත්,
ලේකම්,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 වැනි දින අංක 1703/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද, ගිරිබාව ප්‍රාදේශීය සභාව විසින් 2010.09.28 වැනි දින පැවති මහා සභාව විසින් පිළිගෙන අංක 1714 හා 2011.07.08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසින් නිවේදනය කර ඇති අතර එම අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2025 වර්ෂයට අයකළ යුතු බවට මම තීරණය කරමි.

**උපලේඛනය**

| *I* වැනි තීරුව | *II* වැනි තීරුව | *III* වැනි තීරුව |
|---|---|---|
| | *එක් වරක් පමණක් ගෙවන ලියාපදිංචි ගාස්තුව* | *නවතා තැබීමේ ගාස්තුව* |
| | *රු. ශත* | *රු. ශත* |
| 01. සෑම ත්‍රිරෝද රථයක් සඳහාම | 500 0 | 600 0 |
| 02. වෙනත් වාහන | 500 0 | 300 0 |

( මේ සෑම මුදලක් ම ජනවාරි මස 31ට පෙර ගෙවිය යුතු ය.)

03. කුලී ගමන් අපේක්ෂාවෙන් තොරව ප්‍රාදේශීය සභා භූමියක් තුළ පිහිටි රථගාලක පැයකට අධික කාලයක් සඳහා නවතා තබන වාහනයකින් පහත සඳහන් මුදලක් අය කරනු ලැබේ.

| | *රු. ශත* |
|---|---|
| යතුරු පැදි/ත්‍රීරෝද රථ සඳහා | 30.00 |
| මෝටර් රථ/වෑන්/කුඩා ලොරි සඳහා | 50.00 |
| බස්රථ/ලොරි රථ සඳහා | 100.00 |

10-15/5

---

**ගිරිබාව ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳව අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යයන් ඉටුකරන ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එච්. එම්. එස්. හේරත් වන මම, ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳව ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව 2024.09.09 දිනැති තීරණ අංක 2024 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එස්. හේරත්,
ලේකම්,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 22 හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 දිනැති අංක 520/7 දරන IV(ආ) අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දැන්වීමක් (බැනර් ඇතුළුව) ඉදි කිරීම, ප්‍රදර්ශනය කිරීම හෝ දර්ශනය කිරීමට සැළැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

**උපලේඛනය**

| *අනු අංකය* | *I වැනි තීරුව* | *II වැනි තීරුව රු. ශත* |
|---|---|---|
| 01. | බිත්තියක හෝ තාප්පයක, පුවරුවක, ලැල්ලක හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් සඳහා ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට (වර්ෂයකට) | 100 0 |
| 02. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 01කට අඩු කාලයක් ප්‍රදර්ශනය කිරීම සඳහා - වර්ග අඩියකට | 35 0 |
| 03. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 01 කට නොඅඩු සහ මාස 03කට නොවැඩි කාලයක් සඳහා - වර්ග අඩියකට | 50 0 |
| 04. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 03 කට නොඅඩු කාලයක් සහ මාස 06 කට නොවැඩි කාලයක් සඳහා - වර්ග අඩියකට | 70 0 |
| 05. | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 06 කට නොඅඩු සහ වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා - වර්ග අඩියකට | 90 0 |

10-15/6

---

**ගිරිබාව ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා සතිපොළ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, ගිරිබාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යයන් ඉටුකරන ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එච්. එම්. එස්. හේරත් වන මම ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන සතිපොළ තුළ යම් වර්ග අඩි ප්‍රමාණයකින් 2025 වර්ෂයට අදාළව ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට 2024.09.09 දිනැති තීරණ අංක 2025 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එස්. හේරත්,
ලේකම්,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 120 වගන්තියේ (අ), (ආ) වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව සතිපොළ තුල යම් වර්ග අඩි ප්‍රමාණයකින් 2025 වර්ෂයට අදාළ ගාස්තු පනවා අයකර ගැනීම සුදුසු බව මම තීරණය කරමි.

*උපලේඛනය*

| | |
|---|---|
| **ගිරිබාව සතිපොළ** | රු. |
| වර්ග අඩි 25ට අඩු | 100 0 |
| වර්ග අඩි 25 සිට 50 දක්වා | 140 0 |
| වර්ග අඩි 50 සිට 100 දක්වා | 160 0 |
| වර්ග අඩි 100 ට වැඩි | 200 0 |
| **වරාවැව සතිපොළ** | |
| වර්ග අඩි 25ට අඩු | 100 0 |
| වර්ග අඩි 25 සිට 50 දක්වා | 140 0 |
| වර්ග අඩි 50 සිට 100 දක්වා | 160 0 |
| වර්ග අඩි 100 ට වැඩි | 200 0 |
| **පැරකුම්පුර සතිපොළ** | |
| වර්ග අඩි 25ට අඩු | 150 0 |
| වර්ග අඩි 25 සිට 50 දක්වා | 180 0 |
| වර්ග අඩි 50 සිට 100 දක්වා | 220 0 |
| වර්ග අඩි 100 ට වැඩි | 250 0 |

10-15/7

---

**ගිරිබාව ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂයට අදාළව සේවා ගාස්තු, පෝරම ගාස්තු හා වෙනත් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ගිරිබාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යයන් ඉටුකරන ගිරිබාව ප්‍රාදේශීය සභාවේ ලේකම් වන එච්. එම්. එස්. හේරත් වන මම ගිරිබාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළව 2025 වර්ෂය සඳහා සේවා ගාස්තු, පෝරම ගාස්තු හා වෙනත් ගාස්තු අය කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව 2024.09.09 දිනැති තීරණ අංක 2026 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එස්. හේරත්,
ලේකම්,
ගිරිබාව ප්‍රාදේශීය සභාව.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
ගිරිබාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවකින් හෝ වෙනයම් නීතියකින් පැනවී ඇති බලතල අනුව මෙහි පහත සඳහන් එක් එක් කාර්යය සඳහා එය ඉදිරියෙන් දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් 2025 වර්ෂයේ දී ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මම තීරණය කරමි.

*උපලේඛනය*

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 01. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 250 0 |
| 02. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 250 0 |
| 03. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 150 0 |
| 04. | අනුකුලතා සහතිකයක් ලබාදීමේ ගාස්තුව | 500 0 |
| 05. | වීථි රේඛා පරීක්ෂණ ගාස්තුව | 400 0 |
| 06. | වීථි රේඛා/ගොඩනැගිලි සීමා සහතික පත්‍ර ගාස්තුව | 600 0 |
| 07. | නොපරවා ගැනීමේ සහතික පත්‍ර ගාස්තුව | 500 0 |
| 08. | පිඹුරුපත් අනුමත කිරීමේ ගාස්තුව | 500 0 |
| 09. | **ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ පෙරසැරි ගාස්තුව -** | |
| | (අ). නිවාස සැලසුම් සඳහා - | |
| | වර්ග අඩි 500ට අඩු | 1,000 0 |
| | වර්ග අඩි 500 - 1000ත් අතර | 1,500 0 |
| | වර්ග අඩි 1,000 - 1,500ත් අතර | 2,000 0 |
| | වර්ග අඩි 1,500 - 2,000ත් අතර | 2,500 0 |
| | වර්ග අඩි 2,000 ට වැඩි නම් | 3,000 0 |
| | | |
| | (ආ). ව්‍යාපාරික ස්ථානයක් වන විට - | |
| | වර්ග අඩි 500ට අඩු | 1,000 0 |
| | වර්ග අඩි 500 - 1,000ත් අතර | 2,000 0 |
| | වර්ග අඩි 1,000 - 1,500ත් අතර | 3,000 0 |
| | වර්ග අඩි 1,500 - 2,000ත් අතර | 4,000 0 |
| | වර්ග අඩි 2,000 ට වැඩි නම් | 5,000 0 |
| | | |
| 10. | **දැනට නිමකර ඇති හෝ අර්ධ වශයෙන් නිමකර ඇති ඉදි කිරීමක් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම** | |
| | i. අත්තිවාරම දක්වා වැඩ නිමකර ඇත්නම් වර්ග අඩි 1කට | 1.00 බැගින් |
| | ii. වහලය දක්වා වැඩ නිමකර ඇත්නම් වර්ග අඩි 1කට | 1.50 බැගින් |
| | iii. වැඩ නිමකර ඇත්නම් වර්ග අඩි 1කට | 2.00 බැගින් |

| *අනු. අංකය* | *විස්තරය* | *රු. ශත* |
|---|---|---|
| 11. | **වාහන කුලියට දීම** | |
| | i. ට්‍රැක්ටරය ට්‍රේලරය සමඟ ඉන්ධන සහිතව කුලියට දීම (එක් දිනක් සඳහා) | 11,500 0 |
| | ii. ට්‍රැක්ටරය ට්‍රේලරය සමඟ ඉන්ධන රහිතව කුලියට දීම (එක් දිනක් සඳහා) | 8,000 0 |
| | iii. ට්‍රැක්ටරය ට්‍රේලරය සමඟ ඉන්ධන සහිතව කුලියට දීම (වරුවක් සඳහා) | 6,000 0 |
| | iv. ට්‍රැක්ටරය ට්‍රේලරය සමඟ ඉන්ධන රහිතව කුලියට දීම (වරුවක් සඳහා) | 4,500 0 |
| | v. ජල බවුසරය ඉන්ධන සහිතව කුලියට දීම (එක් දිනක් රඳවා තබා ගැනීම සඳහා) | 11,500 0 |
| | vi. ජල බවුසරය ඉන්ධන රහිතව කුලියට දීම (එක් දිනක් රඳවා තබා ගැනීම සඳහා)<br>● *සැ. යු.* (ජල බවුසරය ලබා ගැනීමේ දී ජල මෝටරය සඳහා ඉන්ධන ඉල්ලුම්කරු විසින් සපයා ගත යුතුය.) | 8,000 0 |
| | vii. ජල බවුසරය ඉන්ධන සහිතව කුලියට දීම (වරුවක් සඳහා) | 6,000 0 |
| | viii. ජල බවුසරය ඉන්ධන රහිතව කුලියට දීම (වරුවක් සඳහා) | 4,500 0 |
| | ix. ජල බවුසරය 01 ක් ලබා දීම<br>*සැ. යු.* (ප්‍රවාහන ගාස්තු වශයෙන් පළමු කිලෝ මීටරය හෝ ඉන් කොටසක් රු. 350 ක් ද, වැඩිවන සෑම කිලෝ මීටරයක් සඳහාම රු. 100 බැගින් ද අය කරනු ලැබේ.) | 1,250 0 |
| | x. බැකෝ ලෝඩරය කුලියට දීම (මීටර් පැය 1ක් සඳහා) | 6,000 0 |
| | xi. මෝටර් ග්‍රේඩරය කුලියට දීම (මීටර් පැය 1 ක් සඳහා) | 8,000 0 |
| | xii. ඩම්ප් ට්‍රක් රථය කුලියට දීම එක් දිනක් සඳහා (උපරිම දුර බර සහිත කි. මී. 100) | 40,000 0 |
| | xiii. ඩම්ප් ට්‍රක් රථය කුලියට පැය 4 වරුවක් සඳහා (උපරිම දුර බර සහිත කි. මී 50) | 20,000 0 |
| | xiv. ඩම්ප් ට්‍රක් රථය දුර අනුව කුලියට දීම කි. මී. 1 ක් සඳහා (අවම වශයෙන් බර සහිත දුර කි. මී. 50 ක් වත් විය යුතුයි) | 400 0 |
| | xv. තණකොළ කපන මැෂිම අක්කර 1 සඳහා<br>ප්‍රවාහන ගාස්තුව සෑම 1 කි.මී. සඳහාම<br>(*සැ. යු.* ඉහත මිල ගණන් ඉදිරියේ දී සිදුවන සංශෝධනයන්ට යටත් වේ.) | 9,000 0<br>200 0<br>බැගින් |
| | xvi. තණකොළ කපන මැෂිම අක්කර 1/2 සඳහා<br>ප්‍රවාහන ගාස්තුව සෑම 1 කි.මී. සඳහාම<br>(*සැ. යු.* ඉහත මිල ගණන් ඉදිරියේ දී සිදු වන සංශෝධනයන්ට යටත් වේ.) | 5,000 0<br>200.00 බැගින් |
| | | |
| 12 | **සතිපොළ ගොඩනැගිලි කුලියට දීම** | |
| | i. පැය 04 ක් හෝ ඊට අඩු කාලයකට | 6,000 0 |
| | ii. පැය 04 ත් 08ත් අතර | 8,500 0 |
| | iii. පැය 08කට වැඩි කාලයකට | 10,000 0 |
| | | |
| 13 | **ක්‍රීඩා පිටි කුලියට දීමේ ගාස්තුව** | |
| | i. දින 1ක් සඳහා | 2,000 0 |
| | ii. වරුවක් සඳහා (පැය 04 ක් සඳහා) | 1,500 0 |
| | iii. වැඩිවන සෑම දිනයක් සඳහාම | 1,500 0 |

| අනු. අංකය | විස්තරය | රු. ශත |
|---|---|---|
| 14 | **ඡායා පිටපත් ලබා දීම** | |
| | i. A4 කොළයක් තනිපිට | 15 0 |
| | ii. A4 කොළයක් දෙපිට | 20 0 |
| | iii. ලීගල් කොළයක් තනිපිට | 25 0 |
| | iv. ලීගල් කොළයක් දෙපිට | 30 0 |
| | v. A3 කොළයක් තනිපිට | 35 0 |
| | vi. A3 කොළයක් දෙපිට | 40 0 |
| | | |
| 15 | **පුස්තකාල ගාස්තු අයකර ගැනීම** | |
| | i. පුස්තකාල සාමාජික ගාස්තු (වැඩිහිටි) | 50 0 |
| | ii. පුස්තකාල සාමාජික ගාස්තු (ළමා ගාස්තු) | 40 0 |
| | iii. පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තුව | 10 0 |
| | iv. පුස්තකාල සාමාජිකත්වය අළුත් කිරීමේ ගාස්තුව (වාර්ෂිකව) | 40 0 |
| | | |
| 16 | **පුස්තකාල දඩ මුදල් අයකර ගැනීම** | |
| | i. දින 01 - 10 දක්වා | රු. 1.00 බැගින් |
| | ii. දින 31 - 90 දක්වා | එක් පොතකට රු. 40.00 බැගින් |
| | iii. දින 91 - 180 දක්වා | එක් පොතකට රු. 80.00 බැගින් |
| | iv. දින 180ට වැඩි දින සඳහා | එක් පොතකට රු. 100.00 බැගින් |
| | | |
| 17 | ප්ලාස්ටික් පුටු 01 ක් කුලියට දීම එක් දිනකට<br>වැඩිවන සෑම දිනකටම රු. 50 බැගින් අය කෙරේ. | 10 0 |
| 18 | සමහට් 01 ක් කුලියට දීම<br>වැඩිවන සෑම දිනකටම රු. 300 බැගින් අය කෙරේ. | 500 0 |
| 19 | අනතුරුදායක ගස් කපා දැමීම සම්බන්ධව ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු | 1,000 0 |
| 20 | මෘත දේහයක් සුසාන භූමියේ තැන්පත් කිරීම සඳහා | 20,000 0 |
| 21 | අලෙවි ප්‍රවර්ධන කාර්යයන් සඳහා දිනකට | 1,500 0 |
| 22 | ගල්/වැලි/බොරළු ප්‍රවාහනය කිරීම වෙනුවෙන් කියුබ් 01 ක් සඳහා මාර්ග නඩත්තු ගාස්තු | 150 0 |
| 23 | ෆිල්ටර් කරන ලද ජලය ලීටර් 1 ක් සඳහා ගාස්තු | 2 0 |

10-15/8

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2024.10.04 | සිකුරාදා | 2024.09.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.11 | සිකුරාදා | 2024.09.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.18 | සිකුරාදා | 2024.10.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.10.25 | සිකුරාදා | 2024.10.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2024.11.01 | සිකුරාදා | 2024.10.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.08 | සිකුරාදා | 2024.10.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.14 | බ්‍රහස්පතින්දා | 2024.11.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.22 | සිකුරාදා | 2024.11.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.11.29 | සිකුරාදා | 2024.11.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2024.12.06 | සිකුරාදා | 2024.11.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.13 | සිකුරාදා | 2024.11.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.20 | සිකුරාදා | 2024.12.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.12.27 | සිකුරාදා | 2024.12.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.